## 288 දෙව් සමිඳුන් හට

දෙව් සමිඳුන් හට සුරලොව මහිමය වේවා
දෙව් ජනයා හට මිහිමත සාමය වේවා

දෙව් සමිඳාණනි සුරලොව රජිඳුනි
මහ බල දෙවිඳුනි පියතුමනී
අපි ඔබ නමදිමු ඔබ හට තුතිදෙමු
ජය ගොස පතුරමු මුළු හදිනි

ජේසු ක්‍රිස්තුනී පිය එක සුදනෙනි
දෙව් අජබාලක සුර රජුනේ
පාපය මෙලොවින් ඉවතටලන ඔබ
අප හට කරුණා කරනු මැනේ

දෙව්පිය දකුණේ තෙදෙස සිහසුනේ
වැජඹෙන ඔබ අප යැදුම අසා
යහපත පතුරන සාමය දෙනු මැන
එක්සත් කළ මැන භේද නසා

පිරිසිදු ඔබමය සමිඳුන් ඔබමය
සැම බලයම සතු කිතු සමිඳේ
සුදතුන් සමඟින් දෙව්පිය මහිමෙන්
නිති දින සැම දෙස ඔබ සැරදේ